www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# හෙද සේවකයන්ට එරෙහිව පොලිස් රාජ්‍ය පියවර

## Sri Lanka: Police state measures against nurses

**විලානි පීරිස් විසිනි**

**2009 අගෝස්තු 20**

මහරගම පිලිකා රෝහලෙහි හෙදියන්ට එරෙහිව ආන්ඩුව පොලිස් රාජ්‍යයක ක්‍රමවේදයන් යොදාගැනීම වනාහි, සමස්ත කම්කරු පන්තියට ම කෙරෙන අනතුරු ඇඟවීමකි. ජනාධිපති මහින්ද රාජපක්ෂ "ජාතිය ගොඩනැඟීමට" ගෙනයන "ආර්ථික යුද්ධයේ" දී, ජීවන තත්ත්වයන් හා සේවා කොන්දේසි රැකගැනීමේ කම්කරු අරගල මැඬීම සඳහා රාජ්‍ය යාන්ත්‍රනයේ සමස්ත බලයම යොදාගැනීමට නොපැකිලෙනු ඇත.

රසායන චිකිත්සාව පිලිබඳ විශේෂ පුහුනුවක් ලත් හෙදියන් වැටුප් වැඩිවීමක් හා වඩා හොඳ ආරක්ෂාවක් ඉල්ලා ජූනි මාසයේ දී අකුරට වැඩ කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කලේය. ආන්ඩුව මෙයට ප්‍රතිචාර දැක්වූයේ සියලුම රසායන චිකිත්සක හෙදියන් දුර බැහැර රෝහල් වෙත මාරුකර යැවීමෙනි. වෘත්තීය සමිතිවල ඉල්ලීම පරිදි අභියාචනාධිකරනය ජුලි 22 දින මාරුවීම් අත්හිටුවන නියෝගයක් පැනවීය. කෙසේ වෙතත් ආන්ඩුව හා සෞඛ්‍ය බලධාරීන් උසාවි තීන්දුව මුලුමනින්ම නොතකා හරිමින් එම හෙදියන් මහරගම රෝහලෙහි යලි සේවයෙහි යෙදවීම ප්‍රතික්ෂේප කලේය.

ජුලි 28 වන දින සිය සාමාජිකයන්ට සහාය පිනිස පිලිකා රෝහලෙහි සමස්ත හෙද කාර්ය මන්ඩලය ම වැඩ වර්ජනය කල අතර ආන්ඩුව හොරිකඩයන් ලෙස නාවික හමුදාවේ හෙදියන් යෙදවීය. එදින ම, මාරුකර යැවූ රසායන චිකිත්සක හෙදියන්ට රෝහල් පරිශ්‍රය තහනම් කල නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරනයේ නියෝගයක් භාරදීම සඳහා ඔවුන්ගේ නිවෙස්වලට පොලිස් කන්ඩායම් පිටත්කර හරින ලදී. හෙදියන් නියෝගයට අවනත නොවුව හොත් අත්අඩංගුවට ගන්නා බවට පොලීසිය ඔවුන්ට අනතුරු ඇඟවූහ.

හෙදියන් අත්අඩංගුවට ගන්නා බවට තර්ජනය කරන අතර වාරයේ ආන්ඩුව, පදනම් විරහිත හේතු දක්වමින් අභියාචනාධිකරන තීන්දුව අත්තනෝමතික ලෙස නිගාවට ලක් කලේය. අගෝස්තු 3 වන දින විනිසුරුවරයා සෞඛ්‍ය අමාත්‍යාංශ නිධාරීන්ට තරවටු කල නමුත්, අගෝස්තු 7 වන දින උසාවියට කරුනු දක්වන ලෙස දැනුම්දීම හැරෙන්නට වෙනත් කිසිදු පියවරක් ගත්තේ නැත. අගෝස්තු 10 වන දින උසාවියට ලිඛිත ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීතිඥයන්, දැනට පුරප්පාඩු පුරවා ඇති බැවින් මාරුකල හෙදියන් එහි සේවයට කැඳවිය නොහැකිය යන, ඉටුකර අවසන් ආන්ඩුවේ ක්‍රියාවක් ලෙස එය හැඳින්වීය. නැවතත් අධිකරනය කිසිදු පියවරක් නොගනිමින් අදහස් විමසීම සඳහා තව කල් අවශ්‍ය බවට ඉදිරිපත්වූ ඉල්ලීමට අවසර ලබා දුන්නේය.

සමස්ත ලංකා සෞඛ්‍ය සේවා සංගමය, ආන්ඩුවේ හෙද නිලධාරීන්ගේ සම්මේලනය හා ස්වාධීන සෞඛ්‍ය කම්කරු සංගමය යන වෘත්තීය සමිති, අධිකරනයට අභියෝග කරන හෝ උසාවියට අපහාස කිරීම පිලිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය වරදකරු කරන ලෙසට ඉල්ලීමේ කිසිදු පියවරක් නොගත්හ. රැකියා හා සේවා තත්ත්වයන් මෙන්ම පොදු සෞඛ්‍ය සේවය ආරක්ෂා කිරීමේ පුලුල් ව්‍යාපාරයක කොටසක් ලෙස හෙදියන් වෙනුවෙන් පෙනී සිටින ව්‍යාපාරයක් පුලුල් ලෙස කැඳවීමට මොනම උත්සාහයක් හෝ දරා නැත.

රසායන චිකිත්සක හෙදියන්ට දැනටමත් සැලකිය යුතු සහයෝගයක් ලැබී තිබේ. පිලිකා රෝහලේ හෙද කාර්ය මන්ඩලය ජුලි 22 හා 27 යන දිනවල වැඩ වර්ජනය කල අතර, කොලඹ, මහනුවර, කුරුනෑගල හා ගාල්ලේ අනෙකුත් රෝහල්වල සෞඛ්‍ය කම්කරුවන් ද සම්බන්ධ වූ ජුලි 28 දින පුලුල්ව පැවති ලෙඩ නිවාඩු දැමීමේ ව්‍යාපාරයට ද සම්බන්ධ වූහ. අමාත්‍යාංශයේ ක්‍රියාව කෙරෙහි කෝපය පලකරමින් හා රසායන චිකිත්සක ඒකක වලට ප්‍රමානවත් පහසුකම් හා පලපුරුදු හෙදියන් අනුයුක්ත කරන ලෙස ඉල්ලමින් පිලිකා රෝහලේ රෝගීන්ගේ ඥාතීන් ද පරිශ්‍රය තුල උද්ඝෝෂනයේ යෙදුනහ.

අගෝස්තු 17 වන දින උසාවි තීන්දුව ප්‍රකාශ කිරීමට නියමිතව තිබූ අවස්ථාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසඳුමක් ඉදිරිපත් කරමින් නිවේදනයක් නිකුත් කලේය. කෙසේ වෙතත් එම එකඟත්වයෙන් හෙදියන්ගේ මුල් ඉල්ලීම් කිසිවක් ලබා දුන්නේ හෝ පිලිකා රෝහලේ මාරුකල හෙදියන් යලි එහි සේවයේ පිහිටුවූයේ හෝ නැත. එමඟින් එකඟවී තිබුනේ කොලඹ හෝ ඒ අවට රෝහල් වෙත මාරුකල හෙදියන්ට වෙනත් තැන් වලට මාරුවීම් අවශ්‍යනම් ඒ සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාවක් දීමෙන් මුල් කොන්දේසිවල යම් වෙනසක් කිරීමට පමනි. වෘත්තීය සමිති සුලු වෙනස්කම් සහිතව මෙම එකඟත්වයට වහාම අනුමැතිය පලකලහ.

රසායන චිකිත්සක හෙදියන්ගේ අරගලයට රාජපක්ෂ ආන්ඩුව දැක්වූ ප්‍රතිචාරය, එහි ඒකාධිපති පාලන ක්‍රමෝපායන් පිලිබඳ තවත් ඇඟවුමකි. හෙදියන්ගේ බලහත්කාරී මාරුවීම් ක්‍රියාත්මක කිරීම සඳහා පොලිස් හා මිලිටරි බලය යෙදවීම මඟින් ආන්ඩුව, නඩුව අසන අතර වාරයේ හෙදියන් යලි සේවයේ පිහිටුවීමට අභියාචනාධිකරනය දුන් නියෝගය අවඥා සහගතව නොතකා හලේය. වැදගත් කාරනය නම් උසාවිය හෝ වෘත්තීය සමිති හෝ ආන්ඩුවේ ක්‍රියාවට අභියෝග නොකිරීමයි.

2006 වසරේ රට යලි සිවිල් යුද්ධයට ඇද දැමූ තැන් පටන් රාජපක්ෂ ආන්ඩුව, වඩ වඩාත් ක්‍රියාත්මක වූයේ පාර්ලිමේන්තුව ව්‍යවස්ථාව හා නීති පද්ධතිය කෙරෙහි සතුරු ආකල්පයක් දරන දේශපාලන-මිලිටරි කල්ලියක් තුලින්ය. ඔහුගේ තන්ත්‍රය, දෙමල සුලුතරයෙන් පමනක් නොව මාධ්‍ය හා දේශපාලඥයන් වෙතින් ද පලවූ විරුද්ධත්වය නිහඬ කිරීමට හා බියගැන්වීම් සඳහා පොලිස් රාජ්‍ය ක්‍රමවේදය යොදා ගෙන තිබේ. මිලිටරිය සමඟ අත්වැල් බැඳගෙන ක්‍රියාත්මක වූ ආන්ඩු ගැති ඝාතක කල්ලි විසින් සිය ගනන් ජනයා මරාදමා ඇත.

යුද්ධය පවතිද්දී රාජපක්ෂ, වැඩ වර්ජනය කරන කම්කරුවන් ජාතික ආරක්ෂාවට තර්ජනය කරමින් එල්ටීටීඊ යට උදව්කරන ද්‍රොහීන් යයි යලි යලිත් හංවඩු ගැසීය. මැයි මාසයේ දී එල්ටීටීඊය පරාජය කර හමුදාව ලත් ජයග්‍රහනයෙන් පසුව ජනාධිපති ප්‍රකාශ කලේ "ජාතිය ගොඩනැගීම" වෙනුවෙන් කම්කරුවන් ද සොල්දාදුවන් මෙන් කැපකිරීම් කල යුතු බවයි. රාජපක්ෂගේ නව "ආර්ථික යුද්ධයෙහි" අරමුන රටතුල දිගහැරෙමින් ඇති බරපතල ආර්ථික අර්බුදයේ බර වැඩ කරන ජනතාවගේ කර මත පාත්කිරීමය.

ඕනෑම අරගලයක්, සිය ජීවන තත්ත්වයන්ගේ නොකඩවා සිදුවන බාදනය පිලිබඳව වැඩ කරන ජනතාව දක්වන විරුද්ධත්වය වඩා පුලුල් පරිමානයකින් උත්ප්‍රේරනය කරනු ඇතැයි යන ආන්ඩුවේ තැති ගැන්ම, සාපේක්ෂව කුඩා සංඛ්‍යාවක්වූ හෙදියන් කෙරෙහි ආන්ඩුව දැක්වූ රුදුරු සැලකීම තුලින් ඇඟවුම් කෙරෙයි. ශ්‍රී ලංකා ආර්ථිකය, දැවැන්ත මිලිටරි වියදම් හා ගෝලීය පසුබෑමෙන් දැඩි ලෙස පීඩාවට පත්වීම හේතුකොටගෙන නය බරින් මිරිකී ඇත.

යුද්ධය දඩ මීමා කරගෙන ආන්ඩුව වැටුප් කැටිකර තිබුන තත්ත්වය තුල ආන්ඩුව මෙන්ම පුද්ගලික සේව්‍යයන් ද අති උද්ධමනයට හිලව් වශයෙන් වැටුප් වැඩිකල යුතුය යන ඉල්ලීම් වලට මුහුනපා සිටියි. කම්කරුවන්ගේ අනෙකුත් කොටස් සේවා කොන්දේසි හා සමාජ සේවා කැපීමට විරුද්ධත්වය පාති. දැඩි පීඩාවකට පත්ව ඇති ඇඟලුම් කර්මාන්තයේ දස දහස් ගනන් රැකියා විනාශ කර තිබේ.

මෙම මස මුලදී ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ සේවකයෝ ආන්ඩුවේ අරමුදල් කැපීමටත්, සේවකයන් සඳහා දෙන ආපදා නය ප්‍රමාද කිරීමට හා රෝහල් කලමනාකරනයේ දූෂනයට එරෙහිව එක්දින පිකට් උද්ඝෝෂන දෙකක් පවත්වා ඇත. කොලඹ හා රාගම ප්‍රධාන රජයේ රෝහල් වල හෙද සේවකයෝ මාර්තු මාසයේ සිට ම ලබාදී නැති නිල ඇඳුම් දීමනාව මුල්කරගෙන වෘත්තීය ක්‍රියාමාර්ගයකට එලඹීමට සූදානම් වෙමින් සිටිති.

වැටුප් වැඩිවීම් හා තවත් ඉල්ලීම් මත අගෝස්තු 28 දින ලංකා විදුලි බල මන්ඩලයේ කම්කරුවන් දිවයින පුරා එක්දින වැඩ වර්ජනයකට සූදානම්ව සිටියි. ලංවිම බලධාරීන් පසුගිය මාසයේ පැවති ඒ හා සමාන එක්දින විරෝධතාව නොතකා හැරියේය. සමස්ත ලංකා වරාය කම්කරු සංගමය කොලඹ බාන් ඔර්ලෝසු කනුව ඉදිරිපිට මේ මස මුලදී උද්ඝෝෂනයක් පවත්වමින් වහාම වැටුප් වැඩිකරන ලෙසත් අතිකාල දීමනා කැපීම නතර කරන ලෙසත් ඉල්ලා සිටියහ.

ලක්ෂ ගනනක් වතු කම්කරුවෝ ද වැටුප් වැඩිවීමක් ඉල්ලා සිටිති. සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ රැකියා විරහිත උපාධිධාරීන් රැකියා ඉල්ලා අගෝස්තු 3 දින සිට කොටුව දුම්රියපල ඉදිරිපිට උපවාසයක යෙදී සිටියි.

පිලිකා රෝහලේ හෙදියන්ට ආන්ඩුව සලකා ඇති ආකාරය, කම්කරුවන්ගෙන් එල්ල වන ඕනෑම අභියෝගයක් මැඩීම සඳහා පොලිස් රාජ්‍ය ක්‍රමවේදය යොදාගන්නා බවට කෙරෙන අනතුරු ඇඟවීමකි. ආන්ඩුවට හා රාජ්‍ය පර්යායට සිය පරිපූර්න යටත්වීම පෙන්නුම්කර ඇති සියලු වෘත්තීය සමිති විශ්වාස කටයුතු නොවේ. පිලිකා රෝහලේ ආරවුල තුලදී වෘත්තීය සමිති තුනම, ආන්ඩුවේ ක්‍රියාවන්ට එරෙහි සියලු විරෝධතා, සංකේත විරෝධයපෑම් පවා, අත්හිටුවා බලහත්කාරී මාරුවීම් පිලිගන්නා "විසඳුමක්" ඇටවීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ අත්වැල් බැඳගත්හ.

එම ව්‍යාපාරය පිලිබඳව *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* විසින් ප්‍රශ්න කිරීමේ දී ජවිපෙ ට හිතවත් ඒසීඑච්එස්යූ සමිතියේ සභාපති එස් ඩී මැදවත්ත උදක්ම චෝදනා කලේ හෙදියන්ට "ඇත්තේ පසුගාමී දෘෂ්ටියක්" බැවින් "සංවිධානය කිරීමට දුෂ්කර" වී ඇති බවටය. සැබවින්ම ඒසීඑච්එස්යූ සමිතිය පවත්වාගෙන යන්නේ ද, ජවිපෙ හිතවත් වෘත්තීය සමිති යුද්ධය පැවති අවධියේ "ජාතිය ඉදිරියෙන් තබනු" යන ආන්ඩුවේ අඬහැරය හමුවේ හිස නමාගත් ක්‍රියා පිලිවෙතම ය. වාර්ගික යුද්ධයට මුලු පිටුබලය දුන් සිංහල අන්තවාදී ජවිපෙ "ජාතිය ගොඩනැගීමේ" තමන්ගේ ම වැඩ පිලිවෙල ඉදිරියට දමා ඇත.

ඉදිරි අරගලවල දී අනෙකුත් කම්කරුවන් ද ආන්ඩුව හා රාජ්‍ය පර්යාය සමඟ ඍජු ගැටුමකට තල්ලු වන අතර එමඟින්, ලාභ පද්ධතියට ම එරෙහි විප්ලවවාදී අරගලයක අවශ්‍යතාව මතු කරනු ඇත. එය, කම්කරු පන්තියේ පවත්නා නායකත්වයන්ගෙන් කැඩී වෙන්වීමක් ද ජාත්‍යන්තර සමාජවාදී ක්‍රියාමාර්ගයක් මත පදනම්වූ ස්වාධීන සංවිධාන ගොඩනැගීමේ ද අවශ්‍යතාවය පෙරට ගෙන එයි. වැඩ කරන ජනතාවගේ අති මූලික අයිතීන් පවා රැකගත හැක්කේ කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා දේශපාලන අරගලයකින් ද සමාජය පුද්ගලික ලාභය සඳහා නොව සමාජ අවශ්‍යතා මුල්කරගෙන ප්‍රතිසංවිධානය කිරීමකින් ද පමනි. හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව වන සමාජවාදී සමානතා පක්ෂය එවන් ඉදිරිදර්ශනයක් සඳහා සටන් වදින එකම පක්ෂයයි.

© www.wsws.org